2016 . 03 . 28

# ද මැසිනොද් විදුහල - කඳාන

# De mezenod college - kandana

21 | B | I

## පළමු වාර පරීක්ෂණය 10 ශ්‍රේණිය

## 2016

**සිංහල භාෂාව හා සාහිත්‍ය**

කාලය පැය 2 ½ යි

නම ............................................................................ පංතිය .............. පන්ති අංකය [ ]

**1 අංක (1) සිට (10) දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.**

I. උත්පත්ති ස්ථානය අනුව **ක,ඛ , ග ,ඝ** අක්ෂර "කණ්ඨජ" අක්ෂර ගණයට අයත් වන්නේ නම් පහත අක්ෂර කාණ්ඩ කුමන ගණයට අයත් දැයි දක්වන්න.

( අ ) **ප, ඵ ,බ ,භ ,ම** (ආ ) **ත, ථ , ද ,ධ ,න**

.................................................... ....................................................

II. පහත දැක්වෙන වගන්තියේ අක්ෂර වින්‍යාසයේ **වැරදි** ලෙස යෙදුන වචන දෙකක් තෝරා නිවැරදි කර ලියා දක්වන්න.

කළමනාකරු මහළු නිවාසයේ සියලු දෙනාවම විදර්ශණා භාවනාවට යොමු කළේය.

(අ )..................................................... (ආ ) ....................................................

III. **"අතු කඩා මොර කන්නා සේ"** යන්නෙන් අයමාර්ග නැතිකර ගැනීම අදහස් කරයි නම් පහත වැකි වල අර්ථ දක්වන්න.

(අ ) හඳුන් වනෙත් ඇත උරුලෑවෝ - ....................................................

(ආ) දැලි පිහියෙන් කිරිකන්නා වාගේ - ....................................................

IV. අන්තඃස්ථ අක්ෂර **"ය, ර, ල, ව"** නම් පහත අක්ෂර වර්ග නම් කරන්න.

(අ ) "ස,ශ ,ෂ ,හ ,ෆ" - ....................................................

(ආ) "ඞ,ණ,න ,ම " - ....................................................

V. පහත සඳහන් පද වල පිල්ලම් පිළිවෙලින් නම් කරන්න.

(අ ) කවිසිළුමිණ - ....................................................

(ආ ) රුධිරාණු - ....................................................

VI. "රිය සක <u>**පෙරළෙමින්**</u> ගැල බඩු නිසල කරමින්
<u>**කියත**</u> උන් මෙතෙපල ආයේය ඇදුරු ගුත්තිල "

ඉරි ඇඳි පද දෙක කවර ක්‍රියා පද ගණයට අයත් වෙයිද?

(අ ) ....................................................

(ආ ) ....................................................

VII. පහත පද වල ඇති තද්ධිත ප්‍රත්‍ය වෙන්කර දක්වන්න.

(අ ) පත්‍රිකා - ....................................................

(ආ ) කැබිලිති - ....................................................

VIII. පහත දැක්වෙන වාක්‍ය **සදොස්** නම් **නිදොස්** කර දක්වන්න.

(අ ) ශාලා තොමෝ අන්ධකාරයෙහි ගිලෙති.

.......................................................................................................

(ආ ) ගෘහ සේවිකාවන් හත්සියක් රියාද් නුවර අනාථ කඳවුරු වල වෙසෙන්නිය .

.......................................................................................................

IX. පහත දැක්වෙන වැකි කර්ම කාරකයට හරවන්න.

(අ ) නරියා කුකුලන් ලුහු බදියි .

.......................................................................................................

(ආ ) නුඹලා අප සාදරයෙන් පිළිගත්තෙහු.

.......................................................................................................

X. පහත පද වල විරුද්ධ පද ලියන්න.

(අ ) උත්තම - .......................................................................

(ආ ) මුකුලිත - .......................................................................

(ලකුණු 2×10 = 20)

**2 අංක ( 1 ) සිට ( 10 ) දක්වා කෙටි පිළිතුරු සපයන්න.**

I. වේදේහ රජ්ජුරුවෝ නම් කවරහුද ? " **යව උන්ට වුවමනා වී නම් කෙළවර අස්තක් ගනුව** "

(අ) මෙය කා විසින් කා හට කරන ලද ප්‍රකාශනයක්ද?

.......................................................................................................

(ආ ) මෙය උපුටා ගත් මුල් කෘතිය කවර යුගයකදී රචනා වුවක්ද?

.......................................................................................................

II. "නොදැනම තමා බල
සබයට අවුත් නො පැකිල"

(අ ) මෙය උපුටා ගත් මුල් කෘතියේ රචකයා කවරෙක්ද?

.......................................................................................................

(ආ ) මෙය රචනා වූ යුගයේ බිහිවූ වෙනත් පද්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

.......................................................................................................

III. (අ ) කුරුණෑගල යුගයේ බිහි වූ සාහිත්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

.......................................................................................................

(ආ ) පන්සිය පනස් ජාතක කතා පොත රචනා කිරීමට මුල්වූ සාහිත්‍ය කෘතිය කුමක්ද?

.......................................................................................................

IV. (අ ) උම්මග්ග ජාතකය ඇසුරින් බිහි වූ වෙනත් සාහිත්‍ය නිර්මාණයක් නම් කරන්න.

.......................................................................................................

(ආ ) ජාතක කතාවක දැකිය හැකි ආකෘතිකමය බෙදීම් තුන මොනවද?

.......................................................................................................

V. " දේවයන් වහන්ස ඇතුළු නුවරදී රහස් කියන්නට නොපිළිවන "

(අ ) මෙය කා විසින් කා හට කරන ලද ප්‍රකාශයක්ද?

.......................................................................................................

(ආ ) මෙම පුද්ගලයා පවසන රහස කුමක්ද?

.......................................................................................................

VI. (අ ) ගුත්තිල කාව්‍ය සඳහා පාදක ජාතක කතාව නම් කරන්න .

.......................................................................................................

( ආ) මෙහි එන බෝධි සත්ව චරිතය නම් කරන්න .

.......................................................................................................

VII. "දේවයිනි මහත් වූ කෝලාහල ශබ්දයෙක අපි කුමක් බවත් නොදනුම්හ."

(අ) මෙහි අපි ලෙස පවසන්නේ කව්රුන්ද නම් කරන්න .

..............................................................................................

(ආ ) පන්සීය පනස් ජාතක කතා පොත සිංහලයට නැගීමට ආරාධනා කලේ කව්රුන්ද?

..............................................................................................

VIII. "ඒ පණ්ඩිතයෝ වනාහි මෙබඳු නුවණැත්තාහ."

(අ ) මෙහි පවසන්නේ කව්රුන් පිළිබඳවද ?

..............................................................................................

(ආ ) මෙම උද්‍ධෘතය ඇතුළත් මුල් කෘතිය ලිවීමට පාදකවූ කෘතිය කාගේ රචනයක්ද ?

..............................................................................................

IX. "කැර මිණි බරණ රැස්
රසින් සුර සැවු සුවහස් "

(අ ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න .

..............................................................................................

..............................................................................................

(ආ ) ඉරි ඇදි පදයේ අදහස ලියා දක්වන්න .

..............................................................................................

X. (අ ) උම්මග්ග ජාතකය රචනා කිරීමට බලපෑ අරමුණ කුමක්ද?

..............................................................................................

(ආ ) ජාතක කත පොත ජනතාව අතර ජනප්‍රිය වීමට බලපෑ හේතු 2ක් දක්වන්න.

..............................................................................................

(ලකුණු 2×10 = 20)

**3. ඉරි ඇඳි පද වල අර්ථය වෙන වෙනම ලියා සමස්ථ කවියේ හෝ ජේදයේ අදහස ලිහිල් බසින් ලියන්න.**

**I. සර්වාභරණයෙන් විභූෂිත ජය අකුසු හා තෝමරාදි ආයුධ ගත් අත් ඇති ව පිට හිඳිනා ඇතරුවන් විසින් ගැවසී ගත්, ඒ රජ්ජුරුවන්ගේ කෝප නමැති ගින්නෙන් නැඟි දුම් කඳ සේ උස් වී, කන්තලින් කන්තල ගසා සිටුවන ලද්දා වූ ඇත් වළල්ලෙකින් ද**

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

**II. කැර මිණි බරණ රැස්**
**රසින් සුර සැවු සුවහස්**
**සුරන් සහ සහසැස්**
**නො කැර සිටියේ අහස් කුස හිස්**

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

III. "මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා දහස් ගණන් කුඩාරම්වල රා පුරා තබ්බා **අනේක ප්‍රකාර මසවුළු** ඒ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස් කොට තබව"යි අමාත්‍යයන්ට විධාන කළහ. එ පවත් පණ්ඩිතයන් වහන්සේට **අන්තස්සර පුරුෂයෝ** කියා යැවූහ.

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

IV. ඒ ගිරා පණ්ඩිතයන්ගේ මෙ බඳු **වතෙක්** ඇත්තේ ය. ඉදින් කිසි තෙනෙකින් ගෙනා හස්නක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු වී නම් උන් වහන්සේගේ **දුසරුවට** බස්නාහ; ඉදින් අමරා දේවීනුත් ඇසුව මනා වී නම් ඇකයෙහි ගොස් හිඳිනාහ;

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

(ලකුණු 4×5 = 20)

---

❖ **4 ප්‍රශ්නයටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් පිළිතුරු සපයන්න.**

4 I. රාජ්‍ය උපදේශකයන් ලෙස මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතය හා කේවට්ට බමුණාගේ චරිතය අතර ඇති වෙනස් කම්.

II. උම්මග්ග ජාතක කතාවේ සාර්ථකත්වයට හේතුවී ඇත්තේ එහි රචකයා යොදාගනු ලැබූ භාෂා රීතියයි. එක් කොටසකට **නිදසුන් දෙක** බැගින් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 15 )

**5.** උම්මග්ග ජාතක රචකයා කේවට්ට බමුණාගේ චරිතය උපහාසයෙන් හා හාස්‍ය රසයෙන් යුක්තව ඉදිරිපත් කරයි. උම්මග්ග ජාතකයේ නියමිත කොටස ඇසුරින් විමසන්න.

**6.** මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතය අනපේක්ෂිත අවස්ථා සඳහා ඉවසීමෙන් මෙන්ම ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්තව මුහුණ දෙන අයුරු නිදසුන් තුනක් ඇසුරින් පහදන්න.

**7.** වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය විදහා පාන කැටපත ගුත්තිල කාව්‍යයි. කාව්‍ය අලංකාරෝක්ති ඇසුරින් පහදන්න.

(ලකුණු 10 )